## විශේෂ නිවේදනයයි

ඊශ්‍රායලයේ වාසය කරන නැවත ශ්‍රී ලංකාව බලා යෑමට ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ලියාපදිංචි වී සිටින සියලුම ශ්‍රී ලාංකික ප්‍රජාව වෙතයි,

### විශේෂ ගුවන් යානාවක් මගින් ශ්‍රී ලංකාවට පිටත්වීම

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් කරන ලද ඉල්ලීම් වලට ප්‍රතිචාර දක්වමින් **මුදල් ගෙවා නිරෝධායනය වීමේ පදනම මත** ශ්‍රී ලංකා රජය විසින් ඊශ්‍රායලය වෙත **2021.01.15** දින ගුවන් යානාවක් එවීමට නියමිතව ඇති බව මෙම තානාපති කාර්යාලය වෙත දැනුම් දී ඇති බව සතුටින් ප්‍රකාශ කර සිටිමු.

ඒ අනුව ගුවන් යානයේ පවතින ආසන පහසුකම් ප්‍රමාණය මත ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ **මේ දක්වා ශ්‍රී ලංකාව බලා යෑමට බලාපොරොත්තුවෙන් සිටින ශ්‍රී ලාංකිකයින් ලියාපදිංචි වී ඇති අනුපිළිවෙල අනුව සුදුසුකම් ලැබූ ශ්‍රී ලාංකිකයන් හට ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් දුරකථන මාර්ගයෙන් දැනුම් දීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව ඔවුන් විසින් මේ සමග අමුණා ඇති අයදුම්පත සිංහල හෝ ඉංග්‍රීසි භාෂාවෙන් නිසි පරිදි සම්පූර්ණ කර ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ඊ මේල් - email ලිපිනයට (slemb.telaviv@mfa.gov.lk) හෝ වට්ස්ඇප් - WhatsApp (0584103510) අංකයට 2020.12.15 දිනට ප්‍රථම ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දැනුම් දෙමු. එමෙන්ම මෙම අයදුම්පත එදිනට (2020.12.15) පෙර මෙම තානාපති කාර්යාලය වෙත නොලැබුනහොත් ඔබ මේ අවස්ථාවේදී ශ්‍රී ලංකාව බලා පිටත්වීමට බලාපොරොත්තු නොවන පුද්ගලයෙකු ලෙස සලකනු ලබන අතර එම අවස්ථාව ලියාපදිංචි ලේඛණයේ සිටින ඊළඟ පුද්ගලයාට හිමි වෙන බව තවදුරටත් දැනුම් දෙමු.**

මෙම ගුවන් යානය පැමිණීම සම්බන්ධව වැඩි විස්තර (පැමිණෙන වේලාව, ප්‍රවේශපත්‍ර මිළදී ගැනීම, PCR පරීක්ෂණ ආදී) මේ වන තෙක් තානාපති කාර්යාලය වෙත දැනුම් දී නොමැති බැවින් එම විස්තර ලද විගස ඔබ සියලු දෙනා වෙත දැනුම් දීමට කටයුතු කරන බවටද අවධාරණයෙන් දන්වා සිටිනු ලැබේ.

එබැවින්, **මේ වන විටත් රැකියාවන්හි නිරත වී සිටින මෙම ගුවන් යානය මගින් ශ්‍රී ලංකාවට යාමට බලාපොරොත්තුවන්නන් විධිමත් ආකාරයට ස්වකීය රැකියාවලින් හිමිවිය යුතු දීමනා (හිඟ වැටුප්, විශ්‍රාම වැටුප්, රක්ෂණ ප්‍රතිලාභ) ආදිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ගැනීමට පියවර ගන්නා මෙන් මෙයින් දන්වා සිටිමු.**

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
ටෙල් අවිව් ඊශ්‍රායලය

**2020.12.07**

**කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් නැවත ශ්‍රී ලංකාවට පැමිණීමට අපේක්ෂා කරන ශ්‍රී ලාංකිකයින් විසින් ඉදිරිපත් කළ යුතු තොරතුරු**

1. මුලකුරු සහිත නම
2. විදේශ ගමන් බලපත්‍ර අංකය
3. ජාතික හැඳුනුම්පත් අංකය
4. උපන්දිනය
5. ස්ත්‍රී පුරුෂ භාවය: පිරිමි/ගැහැණු
6. අවසන් වරට ශ්‍රී ලංකාවෙන් පිටත් වූ දිනය
7. පසුගිය තෙමස තුළ දී සංචාරය කළ රටවල්
8. ඔබේ සම්බන්ධතා තොරතුරු: ජංගම දූරකථන, ඊමේල් සහ වට්ස්ඇප් වැනි සමාජ ජාල (ඔබ සිටින රටෙහි)
9. ඔබ දැනට සිටින රට/කලාපය/රාජ්‍යය
10. රැකියාවක යෙදෙන්නේ නම්, සේවා ස්ථානයේ නම සහ ලිපිනය
11. අධ්‍යාපනය හදාරන්නේ නම්,
    a. අධ්‍යාපන ආයතනයේ නම සහ ලිපිනය (විශ්ව විද්‍යාලය/පාසල/පෙර පාසල යනාදිය)
    b. අධ්‍යයන වර්ෂය/අධ්‍යයන වාරය
12. ඔබ සමඟ ශ්‍රී ලංකාවට යාමට අපේක්ෂා කරන සහකරු හෝ සහකාරිය/ දෙමාපියන්/දරුවන් පිළිබඳ විස්තර
    a. නම්
    b. විදේශ ගමන් බලපත්‍ර අංක
    c. වෘත්තිය/රැකියාව
    d. අයදුම්කරු සමඟ ඇති සම්බන්ධතාවය
13. දැනට පදිංචි ස්ථානයේ ඔබ සමඟ ශ්‍රී ලාංකිකයින් කී දෙනෙක් සිටී ද?
14. ඔබ පදිංචි නිවසේ වෙනත් ජාතිකයන් සිටී ද? එසේ නම්, ඔවුන් කුමන රටවලින් ද?
15. ඔබ කිසියම් නිදන්ගත රෝගයකින් පෙළෙන්නේ ද?
16. ඔබ දිගු කාලීනව ඖෂධ භාවිතා කරන්නේ ද? එසේ නම් කෙටියෙන් විස්තර කරන්න
17. ඔබට උණ, කැස්ස, උගුරේ අමාරුව, හුස්ම ගැනීමේ අපහසුතා වැනි රෝග ලක්ෂණ තිබේ ද?
18. ඔබ කිසියම් ආහාර ද්‍රව්‍යයකට ආසාත්මික ද?
19. කොවිඩ්-19 කාල සීමාවේ දී තුළ ඔබ සමාජ දුරස්ථභාවයට සහ මුහුණු ආවරණ වැනි පුද්ගලික ආරක්ෂක ඇඳුම් ඇඳීමට හුරු වී තිබේ ද?

20. ඔබට ආසන්නතම ශ්‍රී ලංකා දූත මණ්ඩලය/කොන්සල් ජනරාල් කාර්යාලය කුමක් ද?

21. ශ්‍රී ලංකාවේ පදිංචි ලිපිනය

    a. තාවකාලික

    b. ස්ථිර

22. ශ්‍රී ලංකාවේ දුරකථන අංක

    a. නිවාස දුරකථනය

    b. ජංගම දුරකථනය

23. ශ්‍රී ලංකාවේ ඔබගේ නිවසට (තාවකාලික හා ස්ථිර) ළඟම ඇති පොලිස් ස්ථානය

24. ශ්‍රී ලංකාවේ ග්‍රාම සේවා කොට්ඨාශය

25. කරුණාකර ඔබ දැනට සිටින ප්‍රදේශයේ/කලාපයේ කොවිඩ්-19 වසංගතය පිළිබඳ වර්තමාන තත්ත්වය විස්තර කරන්න.

26. ඔබ කොවිඩ්-19 සඳහා නිරෝධායන කාල පරිච්ඡේදයකට මුහුණ දී තිබේද? 'ඔව්' නම් කරුණාකර දිනයන්, ස්ථානය වැනි විස්තර සපයන්න.

27. ඔබේ සහකරු හෝ සහකාරිය හෝ ඔබ සමඟ ජීවත්වන පවුලේ සාමාජිකයන් කොවිඩ්-19 සඳහා නිරෝධායන කාල පරිච්ඡේදයකට මුහුණ දී තිබේද? 'ඔව්' නම්, කරුණාකර දිනයන්, ස්ථානය වැනි තොරතුරු සපයන්න.

28. ඔබ කොවිඩ් -19 සඳහා පරීක්ෂණයකට භාජනය වී තිබේද? 'ඔව්' නම් කරුණාකර දිනය සහ පරීක්ෂණ ප්‍රතිඵල සඳහන් කරන්න?

29. ඔබේ නිවසේ/සේවා ස්ථානයේ/අධ්‍යාපන ආයතනයේ දී (විශ්ව විද්‍යාල, පාසල් සහ පෙර පාසල් ඇතුළුව) කොවිඩ් -19 සඳහා කළ පරීක්ෂණ ධනාත්මක වී තිබේද?

30. මෙම කොවිඩ් -19 සඳහා ධනාත්මක බවට අනාවරණය වූ පුද්ගලයින් ඔබ ආශ්‍රය කර තිබේද?

31. ඔබ ආපසු ශ්‍රී ලංකාවට යාමෙන් පසුව දින 14/21 ක් නිරෝධායනය වීමට ඔබ කැමතිද?

32. ඔබ නිරෝධායනය ගෙවීම් පදනම මත ගත කිරීමට කැමති ආකාරය

☐ දිනකට එක් පුද්ගලයෙකුට රුපියල් 7,500 ක් බැගින් (සියලු ආහාර පාන සහිතව) තරු පන්තියේ හෝටල් කාමරයක් තවත් පුද්ගලයෙකු සමග බෙදා ගැනීමේ පදනම මත (Twin Sharing)

☐ දිනකට එක් පුද්ගලයෙකුට රුපියල් 12,500 ක් බැගින් (සියලු ආහාර පාන සහිතව) තරු පන්තියේ තනි හෝටල් කාමරයක් (Single Occupancy)

33. ඔබ/ඔබේ පවුලේ අය ගුවන් ගමන් ටිකට්පත් මිලදී ගැනීමට සූදානම්ද?

ක්‍රෙඩිට් කාඩ් හෝ අත්පිට මුදලින්, කොළඹ ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ පිහිටි ගුවන් ටිකට් පත් කාර්යාලයට මුදල් ගෙවීම හෝ පහත සඳහන් ගිණුම් සඳහා බැංකු තැන්පතු (දේශීය බැංකු මුදල් හුවමාරු) මගින් මෙම ගුවන් ටිකට්පත් සඳහා ගෙවීම් කළ හැකිය.

1. හැටන් නැෂනල් බැංකුව (HNB)

    a. ගිණුමේ නම: ශ්‍රී ලංකන් එයාර්ලයින් ලිමිටඩ්

    b. ගිණුම් අංකය: 0020 1000 7318

2. ශ්‍රී ලංකා කොමර්ෂල් බැංකුව

    a. ගිණුමේ නම: ශ්‍රී ලංකන් එයාර්ලයින් ලිමිටඩ්

    b. ගිණුම් අංකය: 1030016962

3. ලංකා බැංකුව (BOC)

    a. ගිණුමේ නම: ශ්‍රී ලංකන් එයාර්ලයින් ලිමිටඩ්

    b. ගිණුම් අංකය: 5422402

*(මෙම යෝජිත ගුවන් ගමන් ශ්‍රී ලංකන් ගුවන් සේවයේ බව කරුණාවෙන් සලකන්න. දැනටමත් ශ්‍රී ලංකන් ගුවන් සේවය සමඟ වලංගු ටිකට් පත් වෙන්කරවා ගෙන ඇති මගීන්, සමහර විට අමතර ගාස්තු සහිතව, ඔවුන් භාරගනු ඇත. කෙසේ වෙතත්, අනෙක් සියලුම මගීන් සඳහා ඔවුන්ගේ ටිකට්පත් වාණිජමය කොන්දේසි මත මිලදී ගැනීමට සිදුවනු ඇත.)*

34. ඔබ ලබා දීමට කැමති වෙනත් තොරතුරු තිබේද?

දිනය :                                   අත්සන :

---

**0ffice use only**

| Cluster serial no | Destination /departure | CMB/arrival | Quarantine centre |
|---|---|---|---|
| | | | |
| | | | |